# සුසන්ත මහඋල්පතගේ ආෂාඪ පුෂ්පය නවකතාව

**කුලතිලක කුමාරසිංහ**

Historical novel is a literary genre in which the plot is situated in the past. The kind of novel portrays the manners and social conditions of the persons or times presented in the story while paying attention to other details of the time as well. Writers sometimes choose to explore notable historical figures in the settings , allowing readers to understand how the personalities respond to given situations in their background. Historical novel in the West has it's foundations in the works of Walter Scott and his contemporaries in the 19th century. Susantha Mahaulpatha has already written two historical novels.The first is **Parjanya** based on the Tooth Relic brought to Sri Lanka by prince Dantha and princess Hemamala. The second is **Ashada Pushpaya** based in the Kandyan period, concentrating on the last few years of King Sri Wickrama Rajasinghe. In this the author has attempted to illustrate the historical character Aehelapola Adikaram. His fictious name is Asela Mala. The purpose of this paper is to critically value the above novels for their historical and artistic merit.

ඓතිහාසික නවකතාකරුවකු වන සුසන්ත මහඋල්පතගේ එම ගණයේ දෙවන කෘතිය (2013) **ආෂාඪ පුෂ්පයයි.**[1] ඔහුගේ ප්‍රථම ඓතිහාසික නවකතාව 2012 වසරේ දී රචනා කරන ලද **පර්ජන්‍යා**[2]ය. ඒ වූ කලි ලංකාවට දන්ත ධාතූන් වහන්සේ වැඩමවීම පිළිබඳ පුවත

---

© **විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය කුලතිලක කුමාරසිංහ**
සංස්. ආචාර්ය පූජ්‍ය මීමුරේ ගුණානන්ද හිමි, මහාචාර්ය ඊශා හේවාබෝවල, මහාචාර්ය සුසන්ත මහඋල්පත, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ප්‍රියංකර රත්නායක
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 20 කලාපය, 2012/13,** මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

පාදක කරගෙන සියුම් පරිකල්පනයෙන් හා වර්ණනාත්මක ගුණයෙන් විචිත්‍ර වූ නවකතාවකි.

ඓතිහාසික නවකතාවේ ආදිකර්තෘභූත **වැවර්ලි ස්කොට්ගේ** පිළිගැනීමට අනුව අභීෂ්ට ඓතිහාසික නවකතාවකින් මූලික ලක්ෂණ සතරක් ප්‍රකට විය යුතුය.

1. රටක ඉතිහාසයේ ප්‍රකර්ෂවත් කාල අවධියක් පසුබිම් කරගැනීම
2. එම කාල අවධියට සමාන්තර වූ ඓතිහාසික චරිත මෙන් ම ලේඛකයාගේ පරිකල්පනයෙන් ප්‍රභවය වන මනඃකල්පිත චරිත නිරූපණය කිරීම
3. රමණීය ප්‍රේම වෘත්තාන්තයක් විවරණය කිරීම හා
4. ඓතිහාසික මායාව ජනනයට තුඩු දෙන චරිත ඖදාර්යය නිරූපණය කිරීමේ ශක්‍යතාවෙන් යුත් නිර්මාණාත්මක බස් වහරක් උපයෝගි කරගැනීම

මෙකී ලක්ෂණ ඉස්මතු කරන්නා වූ වෘත්තාන්තයකින් යුත් නිර්මාණය ඓතිහාසික නවකතාවක් ලෙස සැලකේ. අරමුණට අනුව ඓතිහාසික නවකතා හා අවශේෂ නවකතා අතර කිසිදු වෙනසක් දැකිය නො හැකිය. නවකතාව වූ කලි ජීවිත විවරණයකි. නැතහොත් සමාජ විවරණයකි. නොඑසේ නම් මානව ධර්මතා ගවේෂණයකි.

ඓතිහාසික නවකතාවෙන් ද මෙකී කාර්ය සාපල්‍යය ඉටු කරගත හැකිය. ඩබ්ලියු. ඒ. සිල්වාගේ **දෛවයෝගය**, **විජයබා කොල්ලය** හා **සුනේත්‍රා නොහොත් අවිචාර සමය** යන නවකතාවලින් පැහැදිලි ලෙස ම නිරූපණය වී ඇත්තේ ප්‍රකර්ෂවත් ඉතිහාසගත පුවත්ය. එහෙත් සුසන්ත මහඋල්පතගේ **පර්ජන්‍යා** හා **ආෂාඪ පුෂ්පය** යන නවකතාද්වයෙන් නිරූපණය වී ඇත්තේ ප්‍රකර්ෂවත්, ඉතාමත් නිරාකූල හා පැහැදිලි ඓතිහාසික පුවත් නො වේ. එසේ නොවුණු නිසා එම නවකතාද්වයේ අගය අඩුවේ යයි පැවසිය නො හැකිය. ඓතිහාසික, පුරාවිද්‍යාත්මක, සාහිත්‍යය හා ජනශ්‍රැති අනුසාරයෙන් එළිපෙහෙළි කරගත් පුවත් පාදක කරගෙන අපැහැදිලි හා ආකූල වූ ඉතිහාසයට පැහැදිලි හා නිරාකූලබවක් ආරෝපණය කරමින් එය නිවැරදි

ඉතිහාසගත පුවත්ය යන හැඟීම පාඨක සිත්සතන්හි ජනනය වන වන අයුරින් සිදුවීම් හා චරිත ක්‍රියාකාරකම් නිරූපණය කිරීමට සුසන්ත මහඋල්පත පැණවත්වීම අගය කළ යුතුය. විශ්ව සාධාරණත්වයක් කෘතිය තුළට ප්‍රවිෂ්ට කිරීම මත එම නිර්මාණය පාඨකයාගේ වින්දනයට තුඩු දෙන්නේය. ඉතිහාසය පැහැදිලි ලෙස හා නිරාකුල ලෙස ඉදිරිපත් කිරීමෙන් ඉතිහාසඥයාට තෘප්තිමත් විය හැකි වුවත් ඓතිහාසික නවකතාකරුවාට එපමණකින් ම තෘප්තිමත් විය හැකි නො වේ. ඔහුගේ කාර්යභාරය වන්නේ ඉතිහාසය නිරාකුල කිරීම හෝ පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීම ම නො වේ. එම ඓතිහාසික පුවත් අනුසාරයෙන් චරිත සංසටනයට මඟ එළිපෙහෙළි කොට විශ්ව සාධාරණ මානව ජීවිතය, මානව ධර්මතා හා සමාජය විශ්ලේෂණය කිරීමට හා සමාජය ගවේෂණය කිරීමට ඔහු යොමු විය යුතුය. ලෝක සාහිත්‍යයේ ප්‍රකට විශිෂ්ට ගණයේ සාහිත්‍ය කෘති දේශීය වූත්, කාලීන වූත් සීමා අතික්‍රමණය කළ සදාතනික ගැඹුරු අරුත් ප්‍රකට කරන නිර්මාණ බැව් පෙනේ. නිදසුන් ලෙස **තෝල්ස්තෝයිගේ යුද්ධය හා සාමය** බඳු විශාල ප්‍රමාණයේ නවකතාවක් දැක්විය හැකිය. මෙකී ප්‍රබන්ධය විසිඑක්වන සියවසේ ජීවත් වන අපට අතිශයින් දුරස්ථ වුවත් ඉන් අපි උසස් වින්දනයක් මෙන් ම මානව ජීවිතයේ සංකීර්ණ ක්‍රියාකාරීත්වයක් අවබෝධ කර ගන්නෙමු. මෙයට තුඩු දී ඇත්තේ එම සාහිත්‍ය කෘතිවලින් ඉස්මතු වී පෙනෙන පොදු වින්දන ශක්‍යතාව හා විශ්වව්‍යාපී ස්වභාවයන්ය. මහඋල්පත, **පර්ජන්‍යා** කෘතියෙන් අපගේ වින්දන පථය පෝෂණය කිරීමට මෙන් ම ජීවිතාවබෝධයෙන් මානව ධර්මතාවන් ගැඹුරු විමර්ශනයකට හසු කිරීමටත් සාමර්ථ්‍යයක් දක්වා ඇති බව පිළිගත යුතුය. **ආෂාඪ පුෂ්පය** නවකතාවේ බොහෝ චරිත ඓතිහාසික හෝ සාහිත්‍යයික හෝ ජනශ්‍රැතිමය මූලාශ්‍ර ආශ්‍රයෙන් ගොඩනගා ඇති නිසා, ඉතිහාසය විවර කිරීමට හා වින්දන ශක්‍යතා පෝෂණයට වඩා ප්‍රමුඛත්වය දී ඇත.

**පර්ජන්‍යා** නවකතාවෙන් නිරූපණය වූයේ දන්ත කුමරු හා හේමමාලා කුමරිය දළදා වහන්සේ මෙරටට වැඩම කරවීම පිළිබඳ ව නිශ්චිත අනාදිමත් කාලයක සිට බොදුනුවන්ගේ සිත්සතන්හි ආගමික භක්තියෙන් හා ශ්‍රද්ධාවෙන් දිදුලනු ලැබූ ඓතිහාසික මෙන් ම ආගමික අගයෙන් පිරිපුන් පුවතකි. එම පුවත ලේඛකයාගේ සුපසන් පරිකල්පනයෙන් ඔපවත් වූ චරිත උපයෝගි කරගෙන මනුෂ්‍යත්වයත්

අධිමානුෂිකත්වයත් ඉස්මතු කරමින් ගැඹුරින් නිරූපණය කිරීමේ චාතුර්යයක් ප්‍රකට කළ යුතු බව අමුතුවෙන් කිය යුතු නො වේ. ප්‍රබුද්ධ විචාරකයින්ගේ අවධානය එතරම් යොමු නොවුණ ද **පර්ජන්‍යා** පැසසුම් කටයුතු මානව ධර්මතා මිනිස් දිවිය විභූෂණයට තුඩු දෙන ආකාරය විදහා දැක්වූ කාව්‍යමය ගුණයෙන් අලංකෘත වූ නිර්මාණයකි.

**ආෂාඪ පුෂ්පය** නවකතාවට පාදක වූයේ 1815 දී ඉංග්‍රීසි පාලකයින්ගේ සූක්ෂ්ම ක්‍රියාදාමයක ප්‍රතිඵලයක් වශයෙන් කන්ද උඩරට රාජධානිය ඉංග්‍රීසින් විසින් සිය අධිකාරිත්වයට නතු කරගනු ලැබීමත්, එහි දී කන්ද උඩරට පාලකයා ව සිටි කන්නසාමි හෙවත් ශ්‍රී වික්‍රම රාජසිංහට එරෙහි වූ ඇහැලේපොළ ඉංග්‍රීසින්ට පක්ෂපාතී වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ දේශපාලන නොසන්සුන්තාවත්, කන්නසාමි විසින් ඇහැලේපොළගේ පවුල විනාශ කිරීමත්, උඩරට ප්‍රභූන් එකිනෙකා කුළල් කා ගැනීමත්, හා බැඳුණු දේශපාලනික, ආර්ථික හා සාමාජික වශයෙන් ද ඇති වූ අසහනකාරී ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් වශයෙන් සිංහලයන්ගේ ඛේදවාචකය හා බැඳුණු සංසිද්ධි මාලාවකි.

සමස්ත අත්දැකීම කේන්ද්‍ර කොටගත් චරිතය වන්නේ ඇසළබණ්ඩාර හෙවත් ඇහැලේපොළ නිලමේය. ඔහු ඉංග්‍රීසීන්ට පක්ෂ ව කටයුතු කිරීමට පෙලඹුණේ කන්නසාමි හෙවත් ශ්‍රී වික්‍රම රාජසිංහ නම් වඩිග පාලකයාට කැමැත්තක් නොදැක්වූ හෙයින් ඔහුට වඩා ඉංග්‍රීසින්ගෙන් ජනතාවට යුක්තිය හා සාධාරණත්වය ඉටු කරගත හැකි යයි ඔහු විශ්වාස කළ නිසාය. වඩිග පාලකයා පිළිකුල් කිරීම මත ඉංග්‍රීසි පාලකයාගේ හිතෛෂියෙකු වීම ඉඟුරු දී මිරිස් ගත්තා බඳු ක්‍රියාවලියකි.

එහෙත් පාලකයාට එරෙහි ව කුමන්ත්‍රණය කිරීම අනපේක්ෂිත කුරිරු දඬුවම් ක්‍රියාවලියකට ගොදුරු වීමක්ය යන්න ගැන සිතීමට තරම් ඇහැලේපොළ සූක්ෂ්මතාවෙන් යුක්ත නො වීය. උදහස් වූ පාලකයා ඔහුගේ පවුල සමූහ ඝාතනයකට හසු කිරීමට පෙලඹුණේ එහෙයිනි. අප දන්නා මේ ඉතිහාසය අල්පෝක්තියෙන් හෝ අතිශයෝක්තියෙන් නිරූපණය කිරීමට සාහිත්‍යකරුවාට අවකාශ ඇත. ඉතිහාසය මේ යයි කියා පෑම, සාහිත්‍යකරුවාගේ කාර්යය ද නො වේ. ඉතිහාසඥයා හා සාහිත්‍යකරුවා අතර ඇති වෙනස නම්,

පළමුවැන්නා සිදුවූ දේ පවසන අතර දෙවැන්නා සිදු විය හැකි දෑ සාහිත්‍යයික හා කලාත්මක ප්‍රයෝගවලට අනුරූපී වන ලෙස අනාවරණය කිරීමය. සුසන්ත මහලල්පත සාහිත්‍යකරුවා යථාවබෝධයකින් යුතු ව සිදුවිය හැකි දෑ නිරූපණය කිරීමට විමසිලිමත් වීම සැබවින් ම අගය කළ යුතුය.

ඇසලබණ්ඩාර හෙවත් ඇහැලේපොළ, මුරුසි දිවයිනේ සිරගත ව සිටින අතර අතීතය අවලෝකනය කෙරෙන අයුරින් කතාව විවරණය කිරීම ම කලාත්මක ප්‍රයෝගයකි. ඉතිහාසඥයෙකුගේ කාර්යය ඔහු විසින් ඉටු නොකරනු ලබන බව ඓතිහාසික චරිත සමඟ ඩොයිලි, දස්කොන්, ඩිංගිරියා, දොන් බස්තියන්, මිද්‍රි දේවිය, ඉහගම ආදි ජනශ්‍රැති හා සාහිත්‍යයික පොතපත ඇසුරින් ගොඩනගන ලද චරිත සංඝටනය කිරීමෙන් පැහැදිලි වේ. ඇරිස්ටෝටල් සඳහන් කරන පරිදි සාහිත්‍යකරුවා සිදුවිය හැකි දෑ නිරූපණය කරන නිසා කාව්‍ය සාහිත්‍යය නිර්මාණය වඩාත් දාර්ශනික ස්වරූපයක් භජනය කෙරේ. මේ කරුණ සත්‍යයක් බව **පර්ජන්‍යා** නවකතාව විමර්ශනය කිරීමෙන් පසක් කරගත හැකිය. **ආෂාඪ පුෂ්පය** නවකතාවේ ද එකී ශක්‍යතාව නොමැත්තේ ද නො වේ. එහෙත් **පර්ජන්‍යා** නවකතාවේ මෙන් මනුෂ්‍යත්වයේ ආධ්‍යාත්මික ගුණාංග **ආෂාඪ පුෂ්පයෙන්** විශිෂ්ට නිරූපණයකට ලක් වී නොමැත. එසේ වුව ද මේ නවකතාවෙන් ද විවිධ පැතිකඩවලින් මනුෂ්‍යත්වය - මානව ධර්මතා අවලෝකනයට නවකතාකරුවා ප්‍රකට කරන කුසලතාවත්, ශික්ෂණයත් අතිශයින් ම පැසසුම් කටයුතුය. ඇරිස්ටෝටල් වැඩි දුරටත් ප්‍රකාශ කරන ආකාරයට අනුව කාව්‍යයෙන් - සාහිත්‍යයෙන් සාර්වික සත්‍යය නිරූපණය වන අතර ඉතිහාසයෙන් නියත සිදුවීම් පිළිබඳ සත්‍යය විවරණය කෙරේ. **කාව්‍ය ශාස්ත්‍රයේ** විසිතුන්වන පරිච්ඡේදයේ දී කරන විවරණයට අනුව ඓතිහාසික අවස්ථාවලින් එක් ක්‍රියාවක් නොව, එක් කාල පරිච්ඡේදයක් ව්‍යාඛ්‍යාන කෙරේ. මෙහි දී එක් සිද්ධියක් හා අනෙක අතර සම්බන්ධය කෙතරම් තුනී වුව ද එක් පුද්ගලයෙකුට හෝ පුද්ගලයින් වැඩි දෙනෙකුට සිදුවන දෑ ඉදිරිපත් කෙරේ.

මේ පැහැදිලි කිරීමට අනුව සුසන්ත මහලල්පත සාහිත්‍යකරුවාගේ ක්ෂේත්‍රය තුළ තමා විසින් ගොඩනගාගනු ලැබූ අධිකාරත්වයක් දරණ බව නවකතා දෙකෙන් ම ප්‍රකට කෙරේ. ඓතිහාසික චරිතය රසිකයාට අමතක වන තරමට ප්‍රබන්ධාත්මක චරිත කිහිපයක් ගොඩනැගීමට

නවකතා දෙකේ දී ම මහැලපත විමසිල්මත් වීම වැදගත්ය. ඓතිහාසික චරිතයක් වන ඇහැලේපොළ පවා, ලේඛකයා ප්‍රබන්ධාත්මක චරිතයක් ලෙස ගොඩනැගීමට පෙලඹුණු අයුරු එම චරිතය නවකතාව තුළ ඇසළබණ්ඩාර යනුවෙන් හඳුන්වා දෙනු ලැබීමෙන් ම ප්‍රකට කෙරේ.

මේ නවකතාව විකාශනය වී ඇත්තේ ඇසළබණ්ඩාර හෙවත් මහ නිලමේ මුරුසි දිවයිනේ විවෘත සිරගෙයක හුදෙකලා ජීවිතයක් ගත කරමින් ආවර්ජනා මගින් දුඃඛ වේදනාවට, සන්තාපයට හා පසුතැවිලි වීමට පත්වන අවස්ථා අනුසාරයෙනි. ඔහු බොහෝ විට ළතවෙයි. ඒ කරන ලද මෝඩකම්, අමනකම් හා දුරදිග නොසිතා ගන්නා ලද තීරණ හා ක්‍රියාකාරකම් නිසාය. ඔහු තමා අතින් සිදු වූ ප්‍රමාද දෝෂ ගැන සිතයි. ඒ ගැන පසුතැවිලි වෙයි. ඇසළබණ්ඩාර වඩිග පාලනයට එරෙහි වීමට ගොස් ඉංග්‍රීසි උගුලෙහි ගොදුරක් බවට පත් වූයේය. සිංහල බෞද්ධ, පංචශීල ප්‍රතිපත්තියෙහි පිහිටි ඔහු, ප්‍රතිපත්තිගරුක පුද්ගලයෙකු මෙන් ම අපූර්ව ප්‍රේමවන්තයෙක් ද විය. ඇහැලේපොළ පිළිබඳ ව ෆැන්ටසියක් නිර්මාණය කිරීමට නවකතාකරුවා ගෙන ඇති උත්සාහය බොහෝ දුරට සාර්ථකය.

ඕනෑ ම නවකතාවකින් විවරණය වන්නේ මිනිස් භාව සංඝටනයකි. සනාතනික මානව ධර්මතා වන ඊර්ෂ්‍යාව, ආලය, රාගය, ක්‍රෝධය, මාත්සර්යය, තෘෂ්ණාව යන මේ භාව සංඝටනය අනුසාරයෙන් මනුෂ්‍යත්වය විනිවිද දැකීමට දක්ෂ නවකතාකරුවාට අවකාශය සැලසේ. නවකතාවකට විශ්ව සාධාරණත්වය ප්‍රවිෂ්ට වන්නේ පොදු මිනිස් භාවයන් අතර සංඝටනයෙන් හා එම සංඝටනය අනුසාරයෙන් වැදගත් සමාජාර්ථයක් හෝ ජීවිතාර්ථයක් ප්‍රකට කිරීම මතය. ඇසළබණ්ඩාර කිසියම් ප්‍රමාණයකට රාජ්‍යයට බලපෑම් කළ හැකි පුද්ගලයෙක් වූයේය.

ඓතිහාසික නවකතාවේ විශේෂත්වය රඳා පවතින්නේ එම නිර්මාණයට පදනම් වූ සිදුවීම් පද්ධතිය ලේඛකයාගේ ඍජු අනුභූතීන් බවට පත් නොවූ ඈත අවධියකට අයත් වූවක් වීමය. එවිට ලේඛකයා එම සිදුවීම් පද්ධතිය එකට සම්බන්ධ කිරීමට යොමුවන්නේ ඉතිහාසගත පුවත පාදක කරගෙනය. මේ සඳහා මහත් පරිශ්‍රමයක නියැලීමට නවකතාකරුවාට සිදුවේ. සුසන්ත මහැලපත ද මහනුවර යුගයේ ඉතිහාසය අහුමුළු නැර ගවේෂණය කිරීමටත්, ඒ අනුසාරයෙන් සිය

පරිකල්පනය කලාත්මක ලෙස හැසිරවීමටත්, නවකතා මූලධර්ම පද්ධතියට අනුරූපී ලෙස එකී පුවත් ඇසුරින් සිදුවීම් හා සංසිද්ධි ගොඩනැගීමටත් ළගන්නාසුලු කාව්‍යමය බසකින් ඒවා නිරූපණය කිරීමටත් ප්‍රකට කර ඇති විවේක බුද්ධිය සැම අතින් ම පැසසුම් කටයුතුය. ඉමහත් පරිශ්‍රමයක් දරා ඉතිහාසගත පුවත් එක්රැස් කර කතාවක් නිර්මාණය කිරීමෙන් සපල කරගත හැකි වැදගත් පරමාර්ථයක් තිබේ ද? වෙනත් නවකතාවකින් සපල කරගත නොහැකි අභිලාෂයක් ඓතිහාසික නවකතාවලින් ඉටු කරගත හැකි වේ ද? ඓතිහාසික වශයෙන් වැදගත්කමකින් යුත් දැවැන්ත චරිතයක් පිළිබඳ ව නිරාකූල වූත් පැහැදිලි වූත් අවබෝධයක් ලබා ගැනීමට ඓතිහාසික නවකතාව වැදගත් වන්නේ යයි යම් විද්වතෙකුට පැවසීමට පුළුවන. එහෙත් **වැවර්ලි ස්කොට්ගේ** ඓතිහාසික නවකතාකරණය පිළිබඳ විවරණයකට අනුව ඓතිහාසික නවකතාව, ඉතිහාස කතාවක් නොව, ඉතිහාසයෙන් ඉස්මතු වී පෙනෙන සිදුවීම්, සංසිද්ධි, ස්ථාන හා චරිත අනුසාරයෙන් ගොඩනගන ලද කල්පිත වෘත්තාන්තයකි.

මේ තර්කය ඔස්සේ සිතන විට ඉතිහාසය ගැන නොසිතා පාඨකයෙකුට **ආෂාඪ පුෂ්පයෙන්** අපූර්ව වින්දනයක් උකහා ගැනීමේ ශක්‍යතාව පවතී.

**ආෂාඪ පුෂ්පය** නවකතාව මහනුවර යුගය ප්‍රතිචිත්‍රණය කරන කෘතියක් වන නිසා, එම කාලය හා බැඳුණු සිරිත්විරිත්, පුද්ගල පොදු ක්‍රියාකාරකම්, ඇඳුම පැලඳුම ආදිය බොහෝ දුරට තාත්වික හා යථාර්ථරූපී ලෙසත් නිරූපණය කිරීමට නවකතාකරුවාට සිදුවේ. සුසන්ත මහඋල්පත ඒ සම්බන්ධයෙන් දක්වා ඇති අවධානය අතිවිශිෂ්ටය. ඉතිහාසය හා තත්කාලීන සමාජය සූක්ෂ්ම ලෙස නිරීක්ෂණය නොකළ ලේඛකයෙකුට එම කාර්යය මෙතරම් සාර්ථක ලෙස ඉටු කළ නො හැකිය. **පර්ජන්‍යා** සහ **ආෂාඪ පුෂ්පය** යන නවකතාද්වයෙහි ම පසුබිම යථාරූපී නිරූපණයකට හසු කිරීම සඳහා ඓතිහාසික තොරතුරු විස්තර කිරීමට සිදුවේ. **ආෂාඪ පුෂ්පයෙහි** ඇතුළත් මෙබඳු විවරණ එයට නිදසුන් ලෙස දැක්විය හැකිය.

> "උඩරට රාජධානියේ නොයෙකුත් තානාන්තර දරා ඇති ඇසළබණ්ඩාර ලක්දිව භූමි භාගයේ සීමා මායිම් හොඳින් හඳුනයි. කුරුණෑගල රාජ්‍ය සමය බිඳ වැටීමත් සමඟ ම

> නව පාලන කේන්ද්‍රස්ථානය පිහිටුවිය යුත්තේ කඳුකර ප්‍රදේශය හෙවත් මලය රටේ යයි පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා තීරණය කළේය. ඒ සඳහා යැවූ සේනාධිපති ශ්‍රී වර්ධන තෝරාගත්තේ සෙණ්ඛණ්ඩ නම් බමුණකු විසූ උඩවත්ත කැලය ආශ්‍රිත ප්‍රදේශයකි. තුන් පැත්තකින් මහවැලි ගඟෙනුත් එක පැත්තකින් වන තීරයෙනුත් සීමා වූ අභිනවයෙන් ඉදි වූ නගරය සෙංකඩගලපුරය යයි නම් වීය. ඇසළබණ්ඩාර තමාට එල්ල වූ සතුරු පීඩාවන් නිසා කඳුකරයෙන් කොළොම්තොටට පලා ආවෙකි. එහෙත් සැබෑ වශයෙන් අතීතයේ සිදුවූයේ මලය රට, පරාජිතයින්ගේ අභය භූමිය ලෙස චිරස්ථායි වීමය"[3]

> "මේ වන විට ජීවිතයේ අඩ සියවසකුත් දශකයක තව අඩකුත් ගෙවා ඇති ඇසළබණ්ඩාර වෙතින් තවමත් පෞරුෂය පලා ගිය බවක් පෙනෙන්නට නැත. ප්‍රථම ප්‍රේමය හිමි වූ ඒ කොබෝලීල මල රාජාධිරාජසිංහගේ උද්‍යානයේ මුරකාවලට කොටු වෙද්දී පසු කාලයේ ඔහුගේ ප්‍රියම්බිකාව වූයේ වැලිකෙළියේ පටන් එකට හැදුණු වැඩුණු පිළිමතලව්වේ කුමාරිහාමි නම් නො වේ. භාග්‍යයකට හෝ අභාග්‍යයකට ඈ වෙනුවට ඒ තැන ගත්තේ මොනරවිල කැප්පෙටිපොල කුමාරිහාමි හෙවත් ඇසළබණ්ඩාර විසින් පසු ව මිද්‍රි දේවිය වශයෙන් හැඳින්වූ කුලාංගනාවයි. එක්දහස් හත්සිය අසූවේ පෙබරවාරි තුන්වෙනිදා අලුයම් යාමයේ ධනු ලග්නයෙන් උපන් ඒ පින්වත් කුල කුමරිය හා ඇසළබණ්ඩාර විවාහ වූයේ හරියට ම විසිනවවන විය ලැබූ වර්ෂයේ දී ය. එනම් ක්‍රිස්තු වර්ෂ එක්දහස් අටසීයේ දී ය"[4]

ඓතිහාසික මායාව නිරූපණයට මෙබඳු විස්තර කථන උපයෝගි කරගැනීමේ වරදක් නැත. එය ඩබ්ලියු. ඒ. සිල්වාගේ ඓතිහාසික නවකතාවල මෙන් ම ඒ. වී. සුරවීරගේ **සදා මෙලෙස පුර දෙරණේ** නමැති කෘතියෙහි ද දක්නට ලැබේ. එහෙත් ඉතිහාසය හා දින වකවානු පැහැදිලි කරන මෙබඳු වර්ණනා නිසා ම **ආෂාඪ පුෂ්පය** නවකතාව අගය කළ නො හැකිය. එය එක් අතකින් බලන විට අන්තය අමතක කොට මාර්ගය පමණක් හුවා දැක්වීමක් විය හැකි වන හෙයිනි. ඓතිහාසික නවකතාවකට මෙබඳු පසුබිම් වැනුම් හා පරිසර වර්ණනා ප්‍රතික්ෂේප කරනු ලබන්නේ එම කෘතියෙන් නිරූපිත ජීවන පුවතට හැකි තාක් දුරට අව්‍යාජත්වය හා විස්වසනීයත්වය ආරෝපණය කිරීම සඳහාය. පරිසර විස්තර වර්ණනා වූ කලී රසභාව උත්පාදනයට තුඩු දෙන එක් මඟක් පමණි.

ඓතිහාසික නවකතාකරුවා නිරූපණය කරන්නේ ඉතිහාසයේ කිසියම් ප්‍රකර්ෂවත් අවධියකි. එම වර්ණවත් අවධිය වඩාත් ආලෝකමත් කරන්නේ උදාර ගති පැවතුම් ඇති ඓතිහාසික චරිත නිසා බව සැබෑය. ඩබ්ලියු. ඒ. සිල්වාගේ නවකතාවල පළමුවන රාජසිංහ හා පළමුවන විමලධර්මසූරිය හා සඳා මෙලෙස පුර දෙරණේහි සීගිරි කාශ්‍යප එබඳු වර්ණවත් හා ප්‍රකර්ෂවත් ඓතිහාසික චරිත ලෙස සැලකිය හැකිය. මෙකී චරිත ඉතිහාසය අධ්‍යයනය කළ විද්‍යාර්ථීන්ගේ මනස් කුහරයෙහි පත්ලෙහි ම රැඳී පවතින්නේ රණශූරත්වයේ මුදුන් හිණිපෙතට ම නැගි අමරණීය චරිත ලෙසටය. රට ජාතිය වෙනුවෙන් දිවි පරදුවට තබා සටන් කළ ශ්‍රේෂ්ඨ රණවිරුවන් ලෙසටය. විදේශික ආක්‍රමණයන්ට එරෙහි ව සිංහල ජාතිකත්වය ඉහළින් ම ප්‍රදර්ශනය කළ ජාතිකාභිමානී මහා පුරුෂයන් ලෙසටය. සීගිරි කාශ්‍යප පිතෘඝාතකයෙකු ලෙස ඇතමුන් කල්පනා කළ ද ඔහු කලා රසිකත්වයේ උල්පතක් ලෙස සැලකීමට සිදුවේ. මෙලෙස විමසා බලන විට පැහැදිලි වන්නේ ඓතිහාසික නවකතාකරුවා යම් යම් සීමාවන්ට කොටු වී සිටින බවය. මේ නිසා සංකීර්ණ මනුෂ්‍යත්වය පිළිබිඹු කරන චරිත ලෙස ඓතිහාසික චරිත මතු කර දැක්වීම තරමක් දුෂ්කරය. සංකීර්ණ ප්‍රාණවත් චරිත නිරූපණය කිරීමට නොහැකි වීමට තුඩු දෙන තවත් කරුණක් මහාචාර්ය විමල් දිසානායක සඳහන් කරයි.

> "නවකතාවක පැනෙන චරිතයක් හා එම චරිතය වෙසෙන පරිසරය අතර ඇත්තේ සියුම් සම්බන්ධයකි. ඇතැම් සාර්ථක රචනයන්හි හමුවන චරිතයෝ ඔවුන් ජීවත්වන පරිසරයේ නිෂ්පාදන වශයෙන් මැවී පෙනෙති. ලේඛකයා වාසය කරන සමාජය පිළිබඳ ඔහු අත්දැකීමෙන් ලබන තියුණු දැනුමට සමාන අවබෝධයක් පොතපතින් යටගිය සමාජයක් ගැන උකහා ගැනීම අතිශයින් දුෂ්කරය. කිසියම් සමාජයක ජීවත් නොවී එහි අධ්‍යාත්මයට පිවිසිය නොහේ. අද්‍යතන ලේඛකයාට දොළොස්වැනි සියවසේ හෝ තුදුස්වැනි සියවසේ සිංහල සමාජය පිළිබඳ ව ඓතිහාසික ලිපි ලේඛනාශ්‍රයෙන් කිසියම් කරුණු දත හැකි නමුදු එම සමාජයේ සම්මුතිය ලද විවිධ සංස්ථා හා එම සමාජයේ වාසය කළ පුද්ගලයා අතර පැවති සියුම් සම්බන්ධය භාවමය වශයෙන් පසක් කරගැනීමට අවස්ථාවක් නොමැත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් චරිතයත් චරිතයට පිටුපසින් සිටින සමාජයත් අතර පවත්නා සජීව සම්බන්ධතාව පාඨකයාට ඒත්තු යන පරිදි නිරූපණය කිරීමට ඔහු අපොහොසත් වෙයි"[5]

ඇසළබණ්ඩාරගේ චරිතය, ලේඛක කුශලතා හේතු කොටගෙන යම් පමණකට වර්ග චරිත ස්වරූපයෙන් ඇත් කරගෙන සංකීර්ණ චරිතාංග ආරෝපිත චරිතයක් ලෙස ගොඩනැගීමට සමත් වී ඇත. එම චරිතයේ බාහිර වශයෙන් දැකිය හැකි චරිතාංග සජීවී ලෙසින් ගොඩනගන අතර අධ්‍යාත්මික චරිත ලක්ෂණ නිරූපණයට ද ලේඛකයා ප්‍රකට කර ඇති ප්‍රාගුණ්‍යය අගය කළ හැකිය.

**ආෂාඪ පුෂ්පයේ** විශේෂත්වය නම් සම්මත ව්‍යාකරණයට අනුරූපී වූ නිර්මාණාත්මක ගුණයෙන් පෝෂණය වූ වර්ණනාත්මක බස් වහරක් උපයෝගි කර ගැනීමය. එබඳු එක් චරිත වර්ණනයක් මෙසේය.

> "ප්‍රතාපවත් අසරණ මිනිසාගේ දර්ශනය නිසා ළය උණු ව දෙනෙතින් කඳුළු වැගිරෙන්නට යයි. සිය දේශයේ හැඩයත් කඳුළු බිංදුවක ස්වරූපය ගන්නේ යයි ඇසළබණ්ඩාරට මේ හදිසියේ සිහිපත් විය. ඒ කඳුළුවලට ඉඩ දිය යුතු දැයි ඇසළබණ්ඩාර විමසා බැලීය. සමහර විට කෙනෙකු ඉතිහාසයේ තමාගේ නම ලියා තබන්නට සැහැසි වනු ඇත්තේ ස්වාධීන උඩරට රාජ්‍යය ඉංග්‍රීසීන්ට පාවා දුන් අධමයා ලෙසින් වන්නටත් පුළුවන. 'නොඉවසිය හැකි වූ දුක් කන්දරාවක් අකම්පිත ව ඉසිලූ මිනිසා' යයි තමා ගැන ලියා තබන අයෙකු නම් කිසිදා පහළ නොවනු ඇත"[6]

මේ චරිත වර්ණනයෙහි විශේෂත්වය නම් විශේෂණ පද බහුලත්වයයි.

> "රන්වන් හීන්දැරි දරුවාගේ දෑස කාන්තිමත්ය. නිදිබරගතිය නිසා දෑස වඩා ශෝභාමත් විය. කවදත් ඇසළබණ්ඩාරගේ වැඩි ආදරය ඇත්තේ පිරිමි පුතුන් කෙරෙහිය. බාල දියණියන් දෙදෙනාට වඩා ලොකුබණ්ඩාටත් මද්දුමබණ්ඩාටත් තමා වඩා ආදරය කළේ යයි ඇසළබණ්ඩාර අවංක ව පිළිගත් කාරණයකි. වැඩිමහල් දියණිය වඩාගෙන හුරතල් කරන්නට යන්තමින් හෝ අවස්ථාව සැලසුනත් බඩපිස්සියගේ උණුසුම ඇසළබණ්ඩාරට මතක නැත. ඈ ඉපදුණු සමයේ ම වාගේ ඔහු සබරගමුවට අබිනික්මන් කර සිටියේය"[7]

මේ චරිත වර්ණනයෙහි ද වාක්‍යාන්තයෙහි විශේෂණ පද ළගන්නාසුලු ලෙස භාවිත කර ඇත.

වර්ණනාත්මක ව බස යොදා ගත් දෙබස් ඛණ්ඩයක් මෙසේය.

> "මා පද්මාවතී" ඇගේ කටහඬ ඉතා මිහිරිය. "මා අලුත්ගම පද්මාවතී. මා සිතුවේ මිහි බට සුර කුමරෙක් මා දෙසට ඇවිදගෙන එනවා කියායි"

"ඇත්ත ම කියනවා නම් මමත් සිතුවේ කොබෝලීල ගසට පිට දී සිටියේ වන දෙවඟනක් ම කියා තමයි"

"එසේ නොවන බව දැන් වැටහුණා නො වේ ද? මා යකඩ දෝලියක් ව මෙහි පැමිණ තව ම දෙපොහොයක්වත් නෑ"

"මා ඔබ නොදකින්නට හේතුව එය වන්නට ඇති. ඔබටත් දැන් වැටහෙන්නට ඇති නේද දුටු තැනැත්තා සුර කුමරෙක් නොවේ කියා?"[8]

රූප ලාවණ්‍යය සිත්කලු වර්ණනයකට නැගී ඇත. කාව්‍යමය බස් වහර ද ඇතැම් තැන මහඋල්පතගේ නිර්මාණාත්මක බස විභූෂණය කිරීමට තුඩු දී ඇත ද ඔහු වඩාත් ප්‍රියතාවක් දක්වා ඇත්තේ සංකල්ප රූපාත්මක වාක්‍ය යෝජනයටය.

"බණ්ඩාර මස්සිනා, අසරණයෙකු ලෙසින් නොව වෙහෙසට පත් සිංහයෙකු සේ සයනයේ වැතිර ගත්තේය"[9]

"අලුත්ගම දුක්ගන්නා උන්නාන්සේට යැවූ ප්‍රේමපත්‍රවල නම් අකුරු ලියවැල් මෝස්තරයට ලියවුණේ නැත. හැම අකුරක් ම පිරුණු සඳක් සේ ලියා යවන්නට එදා තරුණ පෙම්වතා උත්සාහ කළේය"[10]

"ඇසළබණ්ඩාරගේ සිත සියුම් පිහි තලයකින් සූරා දැමුවාක් බඳු විය"[11]

"අහස් ළඳ හෙළන කඳුළු බිඳු මෙන් වැසි දිය එක දෙක වීථියට ඇද හැළෙන්නට විය"[12]

භාෂාවේ අගය කළ හැකි අනෙක් ගුණාංගය නම් අවස්ථාවෝචිත ලෙස කෙටි හා දිගු වැකිවලින් විභූෂණය වූ වර්ණනා යොදා ගැනීමය.

"ඔහු කඳුකර මිනිසෙකි. යෞවන ප්‍රාන්තය දක්වා ලක්දිව උඩරට රාජධානියේ ජීවත් වූ මිනිසෙකි. ඔහු පළමු වරට මුහුද දැක ගත්තේ මීට දහ පාළොස් අවුරුද්දකට පෙරය. ඒ වන විට ඇසළබණ්ඩාරගේ වයස අවුරුදු හතළිස් එකක් විය. මේ සුවිශාල ජලස්කන්ධය පළමුවරට දකින්නෙකුගේ සිතේ ඇතිවන විමතිය ඔහුට එදා දැනුණේය. කාලයත් සමඟ රළගෙඩි පෙරළෙන විලාසය, තම හදවතේ දුක්ඛ වේගයේ රිද්මයට සමානුපාත වන අයුරු ඔහු හඳුනා ගත්තේය. පසු ව ඒ හැඟීම සුහදයෙකු සමඟ කරන සංවාදයක් විය"[13]

වර්ණනාත්මක, කාව්‍යමය හා සංකල්පරූපාත්මක භාෂා භාවිතය අතින් ඔහු පරිණත ලේඛකයෙකු බව ප්‍රකට කරයි. බොහෝ දුරට

ස්වතන්ත්‍ර රචනා රීතියක් සකස් කරගැනීමට ඔහු කුශලතා සම්පන්න වී ඇත. එසේ වුව ද ඩබ්ලියු. ඒ සිල්වාගේ ඓතිහාසික නවකතාවල රීතියෙන් සමීප ආභාසයක් ලැබීමට පෙලඹුණු අවස්ථා ද දක්නට පුළුවන. මේ වර්ණනය විමසන්න.

> "එක්දහස් හත්සිය අසූවේ පෙබරවාරි තුන් වෙනිදා අලුයම් යාමයේ ධනු ලග්නයෙන් උපන් පින්වත් කුල කුමරිය හා ඇසළබණ්ඩාර විවාහ වූයේ ඇයට හරියට ම විසිවන විය ලැබූ වර්ෂයේ දී ය. එනම් ක්‍රිස්තු වර්ෂ එක් දහස් අටසීයේ දී ය. වයස අවුරුදු විසි නවයේ දී සෙනසුරු ලග්න හා ජන්ම ඒරාෂ්ටක කාලය උරුම කොට සිටි ඈ දුර්දාන්ත රජෙකුගේ ද්වේශයට ලක් ව ශෝචනීය ඉරණමකට මුහුණ දුන්නාය. ඒ වන විට වැන්දඹුවක ව සිටි පිළිමතලවවේ කුමාරිහාමි විවාහ කර ගැනීමට පොරොන්දම් බැලීමක් හෝ වෙනත් සිරිත්විරිත් අනුගමනය කිරීමේ අවශ්‍යතාවක් දෙපාර්ශ්වයට ම නො වීය. සෙනසුරු ඒරාෂ්ටකය තවමත් නොගෙවී ඇත්තේ ඇසළබණ්ඩාරටය"[14]

සිල්වාගේ **විජයබා කොල්ලය, සුනේත්‍රා නොහොත් අවිචාර සමය** බඳු නවකතා අධ්‍යයනය කර ඇති පාඨකයෙකුට මේ රචනා ශෛලිය සිල්වාගෙන් ලද ආභාසය ප්‍රකට කරන්නක් ලෙස පසක් කර ගත හැකිය.

නවකතා කලාවේ බොහෝ අංග ලක්ෂණ කෙරෙහි සැලකිලිමත් වන විට **ආෂාඪ පුෂ්පය** පැසසුම් කටයුතු ප්‍රවණතාවලින් යුක්ත වූයේ වුව ද අනවශ්‍ය සිදුවීම් හා චරිත විස්තර කථන බහුල වීම නවකතාවේ කලාත්මක ගුණය වඩාත් ප්‍රදීපනය කිරීමට බාධකයක් වී ඇත. මේ විස්තර විවරණය කතා තේමාව විකාශනයට කිසිදු බලපෑමක් නො කරයි.

> "මහ නිලමේට සිහිපත් වන්නේ ම වළව්ව අතුපතු ගැමට මදිය සේවිකාවන් හා එක් ව දඟලන ඇගලිල්ලය. ඒ සමඟ ම තිස්සමහාරාමයට ගිය විහාර මහා දේවී සාමණේර නමකගේ කුටිය අස්පස් කළ හැටි ද සිතට එයි. කාවන්තිස්ස සමඟ විවාහප්‍රාප්ත වී නව අවුරුද්දක් ගත වීත් දරුවෙකු නොලැබුණු දුක ඇය නායක හිමියන් සමඟ පවසා සිටියාය. ආවාස ගෙයි කුටියක ඔත්පල ව ප්‍රාණය සැඟ ව යන්නට ආසන්න කුඩා සාමණේර නමක පිළිබඳ දේවියට කීවේ නායක හිමියන්ය. ඒ කුටියට ගිය සැණින් දරු පෙමින් ඔකඳ වුණු ඇය සාමණේරයන් සුවපත් කර ගන්නට උත්සාහ දැරුවාය"[15]

විහාර මහා දේවී පිළිබඳ ව මේ විවරණය කතාවේ සිදුවීම් හෝ චරිත විවරණයට ඓන්ද්‍රීය වශයෙන් බද්ධ නො වේ.

මේ හැරුණු විට ඇතැම් සිදුවීම් විවරණ වාර්තා කථන බවට පත් වී ඇත. ඒවා ඓතිහාසික සිදුවීම් වාර්තාගත කරන ආකාරයකින් නවකතාවට ඇතුළත් වී තිබීම කලාත්මක ගුණයට හානියක් වී ඇත. ඒවායින් නවකතාවේ මුඛ්‍ය කතා පුවත විකාශනයට බලපෑමක් නො කෙරේ. කෙසේ වුව ද සුසන්ත මහැල්පතගේ දෙවන ඓතිහාසික නවකතාව වන මෙය ප්‍රබුද්ධ රසිකයින්ගේ වින්දන ශක්‍යතා වඩාත් වර්ධනය කිරීමට තුඩු දෙන නිර්මාණයක් ලෙස හැඳින්විය හැකිය.

**පාදක සටහන්:**

1. මහැල්පත, සුසන්ත (2013), **අෂාඪ පුෂ්පය**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
2. මහැල්පත, සුසන්ත (2012), **පර්ජන්‍යා**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
3. ආ. පු., 36 පිට.
4. ආ. පු., 49 පිට.
5. ආ. පු., 17 පිට.
6. ආ. පු., 21 පිට.
7. දිසානායක, විමල් (2008), **සනාතන අරගලය**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
8. ආ. පු., 127 පිට.
9. ආ. පු., 134, 135 පිටු.
10. ආ. පු., 143 පිට.
11. ආ. පු., 107 පිට.
12. ආ. පු., 141 පිට.
13. ආ. පු., 144 පිට.
14. ආ. පු., 183 පිට.
15. ආ. පු., 16 පිට.

**ආශ්‍රිත ග්‍රන්ථ:**

1. මහැල්පත, සුසන්ත (2013), **අෂාඪ පුෂ්පය**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
2. මහැල්පත, සුසන්ත (2012), **පර්ජන්‍යා**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.
3. දිසානායක, විමල් (2008), **සනාතන අරගලය**, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.